# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1549 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 06/10/2024<br>පැය 1830 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**අන්තර්ජාලය ඔස්සේ සංවිධානාත්මක ලෙස මුදල් වංචා සිදු කළ විදෙස් ජාතිකයින් පිරිසක් අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

2024.10.06 වන දින අළුයම් කාලයේ හංවැල්ල පාර, ගම්පහ ලිපිනයේ පිහිටි හෝටලයක සහ අවිස්සාවේල්ල පාර, හංවැල්ල ලිපිනයේ පිහිටි පුද්ගලික ආයතනයක් තුල රැඳී සිටිමින් සමාජ මාධ්‍ය ජාලා සහ දුරකථන ඇමතුම් මඟින් මූල්‍ය වංචා වල යෙදී සිටි විදෙස් ජාතිකයින් පිරිසක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලද තොරතුරකට අනුව එම ස්ථාන පරික්ෂා කර එහි සිටි සැකකටයුතු විදෙස් ජාතිකයින් පිරිසක් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් හා සැකකාරියන් අතර චීන ජාතික පිරිමි පුද්ගලයින් 29 ක්, හා කාන්තාවන් 01 ක්, ඉන්දීය ජාතික පිරිමි පුද්ගලයෙකු හා කාන්තාවන් 03 ක්, තායිලන්ත ජාතික පිරිමි පුද්ගලයින් 02 ක් හා කාන්තාවන් 04 දෙනෙකු වේ.

ඔවුන් සන්තකයේ තිබී මූල්‍ය වංචාවන් සිදුකිරීම සඳහා යොදාගන්නා ලද ජංගම දුරකථන 499 ක් ලැප්ටොප් 24 ක් හා ඩෙක්ස්ටොප් 29 ක් විමර්ශන නිලධාරින් භාරයට ගෙන ඇත. සැකකරුවන් සම්බන්ධයෙන් සිදු කළ වැඩිදුර විමර්ශනයේදී මොවුන් විසින් පහත ක්‍රම ඔස්සේ මූල්‍ය වංචාවල යෙදී සිට ඇති බවට නිරීක්ෂණය වී ඇත.

- Investment scam - මෙම සැකකරුවන් මුහුණු පොත ඇතුළු සමාජ මාධ්‍ය ජාලා සහ දුරකථන ඇමතුම් ඔස්සේ හඳුනාගන්නා විවිධ පුද්ගලයින් හට මුදල් ආයෝජනය කිරීමට පොළඹවා මුදල් ලබා ගැනීම් සිදු කර ඇත. මේ සඳහා පූර්ව සූදානම් කර ගත් විවිධ භාෂාවන්, ඇමතුම් සංවාද, කෙටි පණිවිඩ යොමු කිරීම් ප්‍රධාන වශයෙන් සිදු කර ඇති බවට නිරීක්ෂණය වී ඇත.

- Pig butchering Scam - මෙහිදී සමාජ මාධ්‍ය හරහා හඳුනාගත් මැදි වයසේ සහ වැඩිහිටි තැනැත්තන් සමඟ ව්‍යාජ ආදර සම්බන්ධතා ඇති කර ගෙන එම විශ්වාසය මත විවිධ පැකේජයන් ලෙස මුදල් තැන්පත් කිරීමට පොළඹවා ඇති බවට නිරීක්ෂණය වී ඇත.

- එමෙන්ම මෙම කඳවුරේ සේවයේ යෙදී සිටින තැනැත්තන් විසින් නැගෙනහිර ආසියානු රටවල් වන චීනය, ඉන්දුනීසියාව හා තායිලන්තය වැනි රටවල් වල තැනැත්තන් මෙන්ම දකුණු ආසියානු රටවල්වන  තැන්පත්කරුවන් ද මෙම වංචාවට හසු කරගෙන ඇති බවට නිරීක්ෂණය වී ඇත.

මෙම සංවිධානාත්මක සයිබර් වංචා කඳවුරු මියන්මාරය, තායිලන්තය ආශ්‍රිතව ක්‍රියාත්මක වන බව හෙළිවී තිබී ඇති අතර, 2024 අගෝස්තු මස සිට මේ දක්වා සිදු කරන ලද විමර්ශනවලදී ශ්‍රී ලංකාව තුල සිට ද ක්‍රියාත්මක වී ඇති බවට අනාවරණ වී ඇත. තවද සැකකරුවන් සන්තකයේ තිබූ ඉලෙක්ට්‍රොනික හා පරිඝනක උපාංග සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වෝහාරික විද්‍යාගාරය මඟින් පරීක්ෂා කර වාර්තා ලබා ගැනීමට නියමිතව ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර පොලිසිය හා යුරෝපොල් මඟින් ද අවශ්‍ය සහය  ලබා ගනිමින් වැඩි දුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**